# වයඹ පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## අවසාන වාර පරීක්ෂණය 2015
## පෙරදිග සංගීතය

**10 ශ්‍රේණිය** **i කොටස** **කාලය:- පැය 2 යි**

නම/විභාග අංකය:..........................................................................................................................

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවල 1 2 3 4 උත්තර වලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

01. විකෘති ස්වර <u>එකක්</u> සහ <u>හතරක්</u> යෙදෙන රාග දෙක පිළිවෙලින් .

1. ඛමාජ් යමන් 2. භෛරවී බිලාවල්
3. යමන් කාෆි 4. යමන් භෛරවී

02. "සාදු දන්තදා සැන්දෑ කළුවර " යන සරල ගීත නිර්මාණයට පදනම් වූ රාගය වන්නේ

1. ඛමාජ් 2. යමන් 3. බිලාවල් 4. භෛරවී

03. ස ධ ප ධ / ම ප ග ම / නි ධ ස / රි ග ම / මෙම ස්වර පාදය භෛරවී රාගයට අනුව ලියා දැක්වීමට නම් .

1. රි,ධ ස්වර පමණක් කෝමල කළ යුතුය.
2. ග ,නි ස්වර පමණක් කෝමල කළ යුතුය.
3. රි ,ග ,ධ ,නි ස්වර පමණක් කෝමල කළ යුතුය.
4. ග ,ධ, නි ස්වර පමණක් කෝමල කළ යුතුය.

04. ස්වර ලිපියක විභාග අතර මෙලෙස [[ ග ම / ප ]] සංකේතයක් යොදා ඇත්නම් එයින් ප්‍රකාශ වන්නේ

1. ස්වර කණ්ඩය දෙවරක් වාදනය කළ යුතුය.
2. පෙර විභාගයේ ඇති ස්වර කණ්ඩය නැවත වාදනය කළ යුතුය .
3. පෙර ඇති විභාග දෙකේ ඇතුලත් ස්වර නැවත වාදනය කළ යුතුය .
4. මුලින් යෙදූ ස්වර කණ්ඩය වෙත නැවත ගමන් කළ යුතුය .

05. කපිරිඤ්ඤා සංගීත සම්ප්‍රදාය ආශ්‍රයෙන් නිර්මාණය කළ සරල ගීත ගැයූ ගායකයින් දෙපළකි.

1. පණ්ඩිත් අමරදේව මහතා වික්ටර් රත්නායක මහතා
2. එම් -එස් ප්‍රනාන්දු මහතා සී- ටී -ප්‍රනාන්දු මහතා
3. එච් -ඩබ් -රූපසිංහ මහතා එම්- කේ- වින්සන්ට් මහතා
4. ලයනල් රන්වල මහතා රෝහණ බැද්දගේ මහතා

- ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වලට පහත වගුව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| බැස සීතල ගඟුලේ පීන පීන නාමුකෝ නගෝ | සුරරද සමන් සමගින් සුරගන එවර | එන්ඩද මැණිකේ මමත් දියඹටා | දුප්පත්කමට ගොන් බැඳගෙන දක්කනවා |
| සිරි බුද්ධගයා විහාරේ | එතෙර පෙනේ තරඟ බොහෝ දී නද හෝ | ඕලු පිපීලා විල ලෙළ දෙනවා | කළුවන් කළුරුවයි මංගෝ දිලිසෙනවා |
| දැඩිකල මාතා පෙම්බර මාතා | පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට | අක්කෙ අක්කෙ අර බලන්නකෝ | මලේ මලේ ඔය නාමල නෙලා වරෙන් |

06. සමුද්‍රඝෝෂ විරිතට අයත් ගීත ඇතුලත් තීරුව වන්නේ.

1. A  2. C  3. D  4. B

07. D තීරුවේ ඇතුලත් ගීත විශේෂය අයත් වන්නේ.

1. ආඝාතාත්මක ගි  2. අනාඝාතාත්මක ගි
3. සරල ගී  4. නාට්‍ය ගී

08. ග්‍රැමෆෝන් ගීත ඇතුලත් තීරුව වන්නේ .

1. A  2. B  3. C  4. D

09. C තීරුවේ ඇතුලත් මුල් යුගයේ සරල ගිත ගැයූ ගායන ශිල්පීන් දෙපළකි .

1. බී ඇස් පෙරේරා ආර් මුත්තුසාමි  2.ආනන්ද සමරකෝන් මහතා සුනිල් සාන්ත මහතා
3.මොහිදීන් බෙග් එච් ආර් ජෝතිපාල මහතා
4. ධර්මදාස වල්පොල සිසිර සේනාරත්න

10. B සහ D තීරුවලට අයත් ගී ජන ගී වර්ගීකරණයේදී නම් කරන්නේ .

1. සරලගී ග්‍රැමපෝන් ගී  2. සරල ගි ගැමි ගී
3. බැති ගී කපිරිඤ්ඤා ගී  4. සේ ගී ගැමි ගී

11. "සැදෑ කළුවර කුර ගගාවිත් " මෙම ගී පාදය ප්‍රස්තාර කිරීමට සුදුසු තාලයකි.

1. කෙහෙර්වා  2. ඡප් තාලය  3. දීප්චන්දි තාලය  4. ත්‍රිතාලය

12. තබ්ලාවේ දායාව කොටසින් වාදනය කළ හැකි ශුද්ධ අක්ෂර වන්නේ.

1. නා තා තිං තුං  2. ගෙ කත් නා තිට
3. කි ගෙ ධිං ධා  4. නා ධා ධිං තිට

13. තබ්ලා වාදනයක ඇතුලත් **නොවන** අංගයකි.

1. ඡලා  2. ගත්  3. පරන්  4. රේලා

14. ලංකාවේ ජන සංගීතයේ උන්නතියට දායක වෙමින් "හෙළ ගි මඟ" සහ "ලංකාවේ සංගීත සම්භවය" ග්‍රන්ථ රචනා කළ සංගීතඥයින් පිළිවෙලින් දැක්වෙන්නේ.

1. එම්. ජී. පෙරේරා මහතා ජයන්ත අරවින්ද මහතා
2. ආනන්ද සමරකෝන් මහතා සුනිල් ශාන්ත මහතා
3. මහාචාර්ය සුනිල් ආරිය රත්න සුසිල් ජයවිර මහතා
4. ඩබ්ලිව්. බී. මකුලොලුව මහතා සී. ද.එස්.කුලතිලක මහතා

15. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසින් නිර්මාණය කළ " මනමේ සහ සිංහබාහු" නාට්‍ය සඳහා ආභාෂය කරගත් නාට්‍ය රංග සම්ප්‍රදාය හඳුන්වන්නේ.

1. නූර්ති 2. නාඩගම් 3. කෝලම් 4.සොකරි

16. ගී අනුවාදනයක් ශ්‍රවණය කිරීමේදී ඒ සඳහා යොදාගත් සංගීත භාණ්ඩ මොනවාදැයි ළහිරුගෙන් විමසූවිට වාදනය කළ භාණ්ඩ කීපයක් නම් කරන ලදී- මෙසේ භාණ්ඩ හඳුනා ගැනීමට හැකි වූයේ නාදයේ

1. උච්චනීච භේදය 2. තාරතාවය 3. ධ්වනි ගුණය 4.විපුලතාවය

17. ස්වර සංඛ්‍යාතය 256 සහ 384 වන ස්වර දෙක පිළිවෙලින් නම්කරන්නේ.

1. ස , ප 2. ස , ම 3. ස , ස් 4. ස , ග

18. " තෙරේ මේරේ මිලන කි හෙ රෙනා " යන ගීතය අයත් හින්දි චිත්‍රපටය වන්නේ.

1. සංගම් 2. බවුජි බවුරා 3. මධුමති 4. අභිමාන්

19. ගීත ගායනය ආරම්භයත් සමගම ආඝාතය තැබීම හඳුන් වන්නේ.

1. අවග්‍රහ 2. සමග්‍රහ 3. අනාඝාතාත්මක 4. විෂමග්‍රහ

20. " ජග් ජිත්සිං , හරි ප්‍රසාද් චෞරසියා , ශකීර් හුසේන් " යන සංගීතඥයින් ප්‍රසිද්ධිය උසුලන ගායන ශෛලිය හා වාද්‍ය භාණ්ඩ පිළිවෙලින්

1. ඛ්‍යාල් බටනලා තබ්ලා 2. කව්වාලි ගසල් භචන්
3. ගසල් බටනලා තබ්ලා 4. ගසල් තබ්ලා බටනලා

**වයඹ පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**අවසාන වාර පරීක්ෂණය 2015**
**පෙරදිග සංගීතය**
10 ශ්‍රේණිය

## ප්‍රායෝගික පරීක්ෂණය

01. යමන් භෛරවී රාග අතරින් කැමති රාගයක සර්ගම් / ලක්ෂණ /මධ්‍යලය ගීතයක් ගායනය / වාදනය කරන්න.

- ශ්‍රැතිය පවත්වා ගැනීම 2
- ආරෝහණ / අවරෝහණ 2
- ස්ථායි/අන්තරා 4
- සමස්ත ගායනය 2 මුළු ලකුණු 10

02. ගුරුවරයා විසින් ගායනය හෝ වාදනය කරනු ලබන ගිතයට අනුව රිද්ම රටාව නිරූපණාය (තබ්ලාව රබාන තම්මැට්ටම ආදී )
එම රිද්ම රටාවට ගැලපෙන තාලය නම් කිරීම හා අතින් තාල තැබීම

- රිද්ම රටාව නිරූපණයට 2
- තාලය නම් කිරීම 2
- අතින් තාල තැබීම 2
- උච්චාරණය ලයපවත්වා ගැනිම 2
- සමස්ත ඉදිරිපත් කිරීම 2 මුළු ලකුණු 10

03. (i) ආඝාතාත්මක හෝ අනාඝාතාත්මක ජන ගීතයක් ගායනය /වාදනය කිරීම
(ii) (කාලගෝල /මනමේ /සිංහබාහු) කැමති ගීතයක් ගායනය/ වාදනය කිරීම

- ජන ගීතයේ නිවැරදි නාද මාලාව 2
- ශ්‍රැතිය පවත්වා ගැනීම 2
- නිවැරදි පද මාලාව 2
- නාට්‍යෝචිත බව 2
- සමස්ත ගායනය 2 මුළු ලකුණු 10

04. ස්වර පුවරුව වාදනය ( සරල ගී/නූර්ති/චිත්‍රපට/මධ්‍යලය ගී)

- නිවැරදි හස්ත සාදනය 2
- ස්වර වාදනයේ නිවැරදි බව 2
- ශිල්පීය ක්‍රම භාවිතය 2
- තාලානුකූල බව 2
- සමස්ත වාදනය 2 මුළු ලකුණු 10

05. තෝරාගත් භාණ්ඩය වාදනය ( සරල ගී/නූර්ති/චිත්‍රපට/මධ්‍යලය ගී)

- නිවැරදි හස්ත සාදනය 2
- ස්වර වාදනයේ නිවැරදි බව 2
- ශිල්පීය ක්‍රම භාවිතය 2
- තාලානුකූල බව 2
- සමස්ත වාදනය 2 මුළු ලකුණු 10